විභාග අංකය :

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2024

මැයි - 2026

BMGTE 3065 - ව්‍යාපාර මූල්‍යය

උපදෙස්:

I. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 2 කින් (අ කොටස සහ ආ කොටස) සමන්විත වේ.

II. ප්‍රශ්න සංඛ්‍යාව:

‘අ’ කොටස – 10 (බහුවරණ ප්‍රශ්න)

‘ආ’ කොටස – 04

III. සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

IV. ‘අ’ කොටසේ පිළිතුරු පත්‍රය, පිළිතුරු පොතට අමුණන්න.

V. ‘අ’ කොටස විභාග ශාලාවෙන් පිටතට රැගෙන යාම සපුරා තහනම් වේ.

‘අ’ කොටස

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. පහත සඳහන් දෑ අතුරින් මූල්‍ය කළමනාකරණයේ අරමුණක් නොවන්නේ කුමක්ද?

අ) පිරිවැය අවම කිරීම.

ආ) ලාභය උපරිම කිරීම.

ඇ) සීඝ්‍රයෙන් උච්චාවචනය වන ඉපැයීම් වර්ධනයක් පවත්වා ගැනීම.

ඈ) වෙළඳපොළ කොටස උපරිම කිරීම.

2. ආයෝජනය (Investment) යන්න අර්ථ දැක්විය හැක්කේ,

අ) නිවසක් හෝ තට්ටු නිවාසයක් මිලදී ගැනීම සඳහා පුද්ගලයෙකුගේ කැපවීම.

ආ) ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වත්කම් මත ප්‍රාග්ධනය යෙදවීම.

ඇ) භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා මුදල් භාවිතා කිරීම.

ඈ) ජාතික ප්‍රාග්ධන තොගයට සිදු කරන ශුද්ධ එකතු කිරීම්.

3. විවිධාංගීකරණය මගින් මගහරවා ගත හැකි අවදානම කුමක්ද?

අ) ආයෝජන කළඹ අවදානම

ආ) ක්‍රමානුකූල අවදානම

ඇ) ක්‍රමානුකූල නොවන අවදානම

ඈ) මූළු අවදානම

4. අවදානම්- මගහරින (Risk-averse) ආයෝජකයින් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශවලින් සත්‍ය වන්නේ කුමක්ද?

අ) ඔවුන් සැලකිලිමත් වන්නේ ප්‍රතිලාභ අනුපාතිකය ගැන පමණි.

ආ) ඔවුන් සාධාරණ ලෙස සැලකෙන ආයෝජන පිළිගනී.

ඇ) ඔවුන් අවදානම් සහිත ආයෝජන පිළිගන්නේ අවදානම් රහිත අනුපාතයට වඩා වැඩි අවදානම් වාරිකයක් (Risk premiums) ලබා දෙන්නේ නම් පමණි.

ඈ) ඔවුන් අඩු ප්‍රතිලාභ සහ ඉහළ අවදානමක් පිළිගැනීමට කැමැත්තෙන් සිටිති.

5. මුදලේ කාලීන අගය මගින් විවිධ කාල පරිච්ඡේදවල වාර්තා වූ මුදල් ප්‍රවාහයන් සංසන්දනය කිරීමට සහය දක්වන්නේ,

අ) සියලුම මුදල් ප්‍රවාහයන් පොදු කාල ලක්ෂ්‍යයකට වට්ටම් කිරීම මගිනි.

ආ) සියලුම මුදල් ප්‍රවාහයන් පොදු කාල ලක්ෂ්‍යයකට ගෙන ඒම සඳහා සංයුක්ත කිරීම හෝ වට්ටම් කිරීම යන දෙකෙන් එකක් භාවිතා කිරීමෙනි.

ඇ) සියලුම මුදල් ප්‍රවාහයන් පොදු කාල ලක්ෂ්‍යයකට සංයුක්ත කිරීම මගිනි.

ඈ) ඉහත කිසිවක් නොවේ.

6. ද්‍රවශීලතා (Liquidity) සහ ණය පියවීමේ හැකියාව (Solvency) පිළිබඳ අනුපාත මගින් ප්‍රධාන වශයෙන් සමාගමක කුමන හැකියාව තක්සේරු කිරීමට පරිශීලකයින්ට උපකාරී වේද?

අ) විකුණුම් මගින් ලාභ උපයා ගැනීම සහ වෙළඳපොළ මිල ඉහළ නැංවීමට.

ආ) කෙටි කාලීන සහ දිගු කාලීන වගකීම් පියවීමට.

ඇ) ලාභාංශ ගෙවීමට සහ කොටස් ප්‍රාග්ධනය අඩු කිරීමට.

ඈ) තොග ඉහළ නැංවීමට සහ ආදායම අඩු කිරීමට.

7. 2025 වර්ෂය සඳහා මූල්‍ය උත්තෝලනය (Degree of Financial Leverage - DFL) ගණනය කරන්න.

වර්ෂය (Year)	විකුණුම් (Sales) (රු.)	පොලී සහ බදු පෙර ඉපයීම් (EBIT) (රු.)	කොටසක ඉපයීම (EPS) (රු.)
2024	3,000	1,000	10
2025	2,400	700	5

අ) 1.50

ආ) 1.67

ඇ) 2.00

ඈ) 2.50

8. ශූන්‍ය ලාභාංශ ප්‍රතිපත්තියක් (Zero-dividend policy) අනුගමනය කරන සමාගමක් බොහෝ විට සිදු කරන්නේ:

අ) සියලුම උපයීම් කොටස් හිමියන් අතර බෙදා හැරීමයි.

ආ) සෑම වසරකම ස්ථාවර ලාභාංශයක් ගෙවීමයි.

ඇ) නැවත ආයෝජනය කිරීමේ අවස්ථා සඳහා ඉපයීම් රඳවා තබා ගැනීමයි.

ඈ) ලාභය නොසලකා ලාභාංශ ඉහළ නැංවීමයි.

9. කළමනාකරුවන් විසින් ලාභාංශ වැඩි කිරීමක්, අඛණ්ඩව පවත්වාගත හැකි බවට තහවුරු වන තෙක් එය මග හැරීමට ඉඩ ඇත, මන්ද:

අ) ලාභාංශ කපා හැරීම (Dividend cuts) මගින් වෙළඳපොළට අහිතකර සංඥා (Negative signals) නිකුත් විය හැකි බැවිනි.

ආ) ලාභාංශ ගෙවීම නීතියෙන් තහනම් කර ඇති බැවිනි.

ඇ) කොටස් හිමියන් සියලුම ලාභාංශ කෙරෙහි අකමැත්තක් දක්වන බැවිනි.

ඈ) ලාභාංශ ගෙවීම මගින් කොටසක ඉපයීම (EPS) ශූන්‍යය දක්වා අඩු කරන බැවිනි.

10. පහත සඳහන් ඒවායින් කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ අරමුණ වඩාත් හොඳින් පැහැදිලි කරන්නේ කුමක්ද?

අ) ආයතනයේ ප්‍රාග්ධන ව්‍යුහය (Capital structure) ස්ථිරව තීරණය කිරීම.

ආ) කොටස්වල වෙළඳපොළ මිල ගණනය කිරීම.

ඇ) ලාභාංශ ගෙවීමේ අනුපාතය පමණක් (Dividend payout ratio) තීරණය කිරීම.

ඈ) කෙටි කාලීන මුදල් ගලා ඒම්, ගලා යෑම් සහ මූල්‍ය අවශ්‍යතා කළමනාකරණය කිරීම.

(ලකුණු 02 x 10 = ලකුණු 20)

'ආ' කොටස

ප්‍රශ්න අංක 01

ඇ) මූල්‍ය ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය අතර වෙනස දක්වන්න. **(ලකුණු 04)**

ආ) සංවිධානයක ශේෂ පත්‍ර ආකෘතිය (Balance sheet model) දක්වා, එය මූල්‍ය කළමනාකරණයට සම්බන්ධ වන ආකාරය සාකච්ඡා කරන්න. **(ලකුණු 06)**

ඇ) ABC සමාගම නිෂ්පාදන කටයුතු සඳහා වඩාත් සුදුසු යන්ත්‍රය මිලදී ගැනීමට නව යන්ත්‍ර දෙකක් ඇගයීමට ලක් කරයි. එක් යන්ත්‍රයක පිරිවැය රු. 200,000 ක් බැගින් වන අතර යන්ත්‍ර දෙකෙහිම ආයු කාලය වසර 5 කි. මෙම යන්ත්‍ර දෙක සරල රේඛීය පදනම මත ක්ෂය කරනු ලැබේ. යන්ත්‍ර දෙකෙහි සුන්බුන් අගයන් පහත පරිදි වේ.

යන්ත්‍රය	A	B
සුන්බුන් අගය	රු. 20,000	රු. 25,000

A සහ B යන්ත්‍රවල ආරම්භක කාරක ප්‍රාග්ධන ආයෝජනය පිළිවෙලින් රු. 30,000 සහ රු. 40,000 කි. කාරක ප්‍රාග්ධනය 5 වන වසර අවසානයේදී සම්පූර්ණයෙන්ම නැවත අය කර ගනු ලැබේ.

A යන්ත්‍රය සඳහා පළමු නඩත්තු ගෙවීම රු. 22,000 ක් වුවද, එය වාර්ෂිකව 9% කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. B යන්ත්‍රයේ වාර්ෂික නඩත්තු පිරිවැය 1 වන වසරේදී රු. 28,000 ක ඉහළ අගයක් ගන්නා අතර එය වාරිකව 7% කින් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නව යන්ත්‍ර මගින් විචල්‍ය පිරිවැය අඩු කිරීමට ඉඩ ඇති බැවින්, භාවිතා කරන යන්ත්‍රය අනුව දායකත්වය වෙනස් වේ. එක් එක් යන්ත්‍රයෙන් ලැබෙන දායකත්වය (නඩත්තු පිරිවැය හැර) පහත වගුවේ දක්වා ඇති අතර, අරමුදල් ගලා ඒම එක් එක් වසර අවසානයේ සිදුවන බව උපකල්පනය කෙරේ.

වසර	1	2	3	4	5
දායකත්වය - A යන්ත්‍රය (රු. '000)	60	75	90	105	120
දායකත්වය - B යන්ත්‍රය (රු. '000)	70	85	95	110	125
වට්ටම් අනුපාතය 12%	0.893	0.797	0.712	0.636	0.567

මූල්‍ය කළමනාකරු ප්‍රාග්ධන පිරිවැය 12% ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කරයි. බදු නොසලකා හැරිය හැක.

ඔබ පහත සඳහන් දෑ ගණනය කරන්න.

ඇ) A සහ B යන්ත්‍රවල ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතිකය (ARR). **(ලකුණු 04)**

ආ) A සහ B යන්ත්‍රවල ශුද්ධ වර්තමාන අගය (NPV). **(ලකුණු 04)**

ඇ) තෝරා ගනු ලබන්නේ කුමන යන්ත්‍රයද? පැහැදිලි කරන්න. **(ලකුණු 02)**

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක **02**

අ) ක්‍රමානුකූල අවදානම (Systematic risk) සහ ක්‍රමානුකූල නොවන අවදානම (Unsystematic risk) අතර වෙනස පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

ආ) මුදලේ කාලීන අගයට අදාළ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. 2025 අගෝස්තු 10 වන දින නඳුන් තම සේවායෝජකයාගෙන් රු. 15,000 ක් ණයට ගත්තේය. නඳුන් 7% ක වාර්ෂික පොලී අනුපාතයක් ගෙවීමට එකඟ වන්නේ නම්, ණය කාලය මාස 19 ක් සඳහා ඔහු ආපසු ගෙවිය යුතු මුළු මුදල ගණනය කරන්න.

ii. ඔබ විසින් රු. 9,000 ක්, 12% ක වාර්ෂික පොලියක් ත්‍රෛමාසිකව සංයුක්ත වන (වැල් පොලියට) ගිණුමක තැන්පත් කළහොත්, වසර 12 කට පසු එම ගිණුමේ ඇති මුළු මුදල කොපමණද?"

iii. මාස 16 කට පසු ගිණුමේ රු. 40,000 ක් තිබීම සඳහා, අර්ධ වාර්ෂිකව සංයුක්ත වන (වැල්පොලියට) 24% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ ඔබ අද දින තැන්පත් කළ යුතු මුදල කොපමණද?

(ලකුණු 02 x 3 = ලකුණු 06)

ඇ) පසුගිය වසර හතර තුළ M සහ N යන සුරැකුම්පත් සඳහා ලැබී ඇති ප්‍රතිලාභ සහ ඒවායේ සම්භාවිතාවන් පහත පරිදි යැයි උපකල්පනය කරන්න.

වසර	සුරැකුම්පත් M		සුරැකුම්පත් N	
	සම්භාවිතාව	ප්‍රතිලාභ (%)	සම්භාවිතාව	ප්‍රතිලාභ (%)
2025	0.10	-17	0.05	-15
2024	0.40	25	0.15	20
2023	0.15	13	0.35	35
2022	0.35	18	0.45	10

ඔබ පහත සඳහන් දෑ ගණනය කරන්න.

i. සුරකුම්පත් M සහ N හි සම්මත අපගමනය. **(ලකුණු 04)**

ii. වඩාත් අවදානම් සහගත ආයෝජනය කුමක්ද? පැහැදිලි කරන්න. **(ලකුණු 02)**

ඈ) ප්‍රතිලාභ සංකල්ප ආශ්‍රිත පහත සඳහන් ගැටලු විසඳන්න.

i. දී ඇති වසර 7 ක ප්‍රතිලාභ අනුපිළිවෙළ වන 88%, -7.5%, 95%, -8.5%, 92%, -5.5% සහ 50% භාවිතා කරමින්, එම ආයෝජනයේ ජ්‍යාමිතික මධ්‍යන්‍ය ප්‍රතිලාභය (Geometric Mean Return) ගණනය කරන්න **(ලකුණු 02)**

ii. සමන් විසින් මීට වසර නවයකට පෙර එක් කොටසක් රු. 245 බැගින් XYZ සමාගමේ කොටස් 350 ක්, මිලදී ගන්නා ලදී. එම කොටසක වර්තමාන වෙළඳපොළ මිල, මිලදී ගත් මිලට සාපේක්ෂව 87% කින් වර්ධනය වී ඇත. මේ දක්වා ඔහුට එක් කොටසකට රු 16 බැගින් වූ ලාභාංශ ගෙවීම් 12 ක් ලැබී තිබේ. සමන්ගේ රඳවා ගැනීමේ කාලසීමාවට ප්‍රතිලාභය ගණනය කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 03

ආ) සීමිත ලංකා ආහාර නිෂ්පාදන පොදු සමාගම ෆුඩ්ස් (Lanka Foods PLC) විසින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත මූල්‍ය තොරතුරු සපයා ඇත.

විස්තරය	වටිනාකම (රු.)
ශුද්ධ ආදායම (Net Income)	120,000
ශුද්ධ විකුණුම් (Net Sales)	1,200,000
විකුණු භාණ්ඩවල පිරිවැය (Cost of Goods Sold)	720,000
මුළු වත්කම් (ආරම්භක ශේෂය)	750,000
මුළු වත්කම් (අවසාන ශේෂය)	850,000
ජංගම වගකීම් (Current Liabilities)	150,000
මුදල් (Cash)	60,000
කෙටි කාලීන ආයෝජන (Short-term Investments)	40,000
ණයගැති ගිණුම් (ආරම්භක ශේෂය)	90,000
ණයගැති ලැබිය යුතු ගිණුම් (අවසාන ශේෂය)	110,000
තොගය (අවසාන ශේෂය)	80,000

මුළු වගකීම් (Total Liabilities)	340,000
සමස්ත කොටස් හිමියන්ගේ හිමිකම (ආරම්භක ශේෂය)	380,000
සමස්ත කොටස් හිමියන්ගේ හිමිකම (අවසාන ශේෂය)	510,000
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	කොටස් 50,000
කොටසක වෙළඳපොළ මිල	රු. 36
කොටසකට වාර්ෂික ලාභාංශය	රු. 4.00
පොලී වියදම (Interest Expense)	20,000
ආදායම් බදු වියදම (Income Tax Expense)	40,000

ඉහත තොරතුරු පාවිච්චි කරමින්, ලංකා ෆුඩ්ස් පී.එල්.සී ආයතනය සඳහා පහත සඳහන් ගිණුම්කරණ අනුපාත ගණනය කර ඒවා අර්ථය පැහැදිලි (Interpret) කරන්න.

i. ක්ෂණික අනුපාතය (Quick Ratio)
ii. ණයගැති ගිණුම් පිරිවැටුම් අනුපාතය (Accounts Receivable Turnover Ratio)
iii. මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය (Total Asset Turnover Ratio)
iv. පොලී ආවරණ අනුපාතය (Interest Coverage Ratio)
v. මිල-ඉපයීම් අනුපාතය (Price-Earnings Ratio)

(ලකුණු 02 x 05 = 10)

ආ) සන්රයිස් මැනුෆැක්චරින් පී. එල්.සී (Sunrise Manufacturing PLC) ආයතනය අවශේෂ ලාභාංශ ප්‍රතිපත්තියක් (Residual Dividend Policy) අනුගමනය කරන අතර, ඉදිරි වර්ෂය සඳහා පහත මූල්‍ය තොරතුරු සපයා ඇත.

විස්තරය	වටිනාකම
ආයෝජිත ප්‍රාග්ධනය	රු. 2,000,000
ඉලක්කගත ප්‍රාග්ධන ව්‍යුහය (Target Capital Structure)	40% ණය (Debt), 60% හිමිකම (Equity)
පුරෝකථනය කළ ශුද්ධ ආදායම (Forecasted Net Income)	රු. 1,500,000

i. අවශේෂ ලාභාංශ ආකෘතිය (Residual Dividend Model) භාවිතා කරමින් ගෙවිය යුතු ලාභාංශ මුදල ගණනය කරන්න.

(ලකුණු 04)

ii. ප්‍රාග්ධන අයවැය රු. 2,400,000 දක්වා ඉහළ ගියහොත්, එම වෙනස ලාභාංශ ගෙවීමේ වටිනාකමට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 02)

ඇ) මෙහෙයුම් උත්තෝලනය (Operating leverage) සහ මූල්‍ය උත්තෝලනය (Financial leverage) යන දෙකම ආයතනයක අවදානම කෙරෙහි බලපායි.
මෙහෙයුම් උත්තෝලනය සහ මූල්‍ය උත්තෝලනය අතර වෙනස කෙටියෙන් දක්වන්න. තවද, මෙම එක් එක් උත්තෝලනය ආයතනයක බීටා (Beta) අගය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක **04**

අ) සීමිත පාරිභෝගික පොදු සමාගම (Consumer Products PLC) සිය ප්‍රාග්ධන ව්‍යුහය සහ වෙළඳපොළ තොරතුරු සම්බන්ධයෙන් පහත දත්ත සපයා ඇත.

විස්තරය	වටිනාකම
අවදානම් රහිත ප්‍රතිලාභ අනුපාතිකය (Risk-free Rate) (Rf)	6%
වෙළඳපොළ ප්‍රතිලාභ අනුපාතිකය (Market Return) (Rm)	14%
බීටා අගය Beta (β)	1.1
බදු පෙර ණය පිරිවැය (Cost of Debt before Tax)	10%
සමාගම් බදු අනුපාතිකය (Corporate Tax Rate)	28%
හිමිකම් ප්‍රාග්ධන අනුපාතය (Equity Proportion)	55%
ණය ප්‍රාග්ධන අනුපාතය (Debt Proportion)	45%

i. ප්‍රාග්ධන වත්කම් මිලකරණ ආකෘතිය (CAPM) භාවිතා කරමින් හිමිකම් පිරිවැය (Cost of Equity) ගණනය කරන්න. **(ලකුණු 02)**

ii. බදු පසු ණය පිරිවැය (After-Tax Cost of Debt) ගණනය කරන්න. **(ලකුණු 02)**

iii. බර තැබීම් ප්‍රාග්ධන පිරිවැය (WACC) ගණනය කරන්න. **(ලකුණු 02)**

iv. සමාගම සිය ප්‍රාග්ධන ව්‍යුහය 60% හිමිකම සහ 40% ණය ලෙස වෙනස් කරන්නේ නම්, නැවත WACC අගය ගණනය කර එම වෙනස මඟින් සමාගමට වාසියක් අත්වේදැයි කෙටියෙන් අදහස් දක්වන්න.

(ලකුණු 02)

ආ) සීමිත හාබර් මාට් පොදු සමාගම 2025 වර්ෂය සඳහා පහත මූල්‍ය තොරතුරු වාර්තා කර ඇත.

විස්තරය (**Description**)	වටිනාකම (**Amount**) (රු.)
විකුණූ භාණ්ඩවල පිරිවැය (**Cost of Goods Sold)**	960,000
සාමාන්‍ය තොග ශේෂය (**Average Inventory)**	120,000
ශුද්ධ විකුණුම් (**Net Sales)**	1,440,000
සාමාන්‍ය ලැබිය යුතු ගිණුම් ශේෂය (**Average Accounts Receivable)**	160,000
සාමාන්‍ය ගෙවිය යුතු ගිණුම් ශේෂය (**Average Accounts Payable)**	80,000

ගණනය කිරීම් පෙන්වන්න. (වසරකට දින 365 ක් ලෙස උපකල්පනය කරන්න)

i. තොග පිරිවැටුම (Inventory Turnover) සහ තොග රඳවා ගැනීමේ කාලසීමාව (Inventory Period) ගණනය කරන්න.

(ලකුණු 02)

ii. ණයගැති පිරිවැටුම (Receivables Turnover) සහ ණය එකතු කිරීමේ කාලසීමාව (Debt collection period) ගණනය කරන්න.

(ලකුණු 02)

iii. ණයහිමි පිරිවැටුම (Payables Turnover) සහ ණයහිමියන් පියවීමේ කාලසීමාව (Debt payment period) ගණනය කරන්න.

(ලකුණු 02)

iv. මෙහෙයුම් චක්‍රය (Operating Cycle) සහ මුදල් පරිවර්තන චක්‍රය (Cash Cycle) ගණනය කරන්න.

(ලකුණු 02)

ඇ) අතේ ඇති කුරුල්ලාගේ සිද්ධාන්තය Bird-in-the-Hand Theory) සහ බදු මනාප සිද්ධාන්තය (Tax Preference Theory) සංසන්දනය කරමින්, එමඟින් ලාභාංශ ගෙවීමේ තීරණ කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)